

Fig. 1



Fig. 2



Fig. 3

# ඡන්දස

පූජ්‍ය බලදොර ඉන්දජෝති හිමි

The word *Chandas* is to be represented vital part in both Vedic and Classical Sanskrit Literature. From the time of uncertain history, in Indian tradition, it is believed that knowledge has been passed down by memorizing the mantras from generation to generation orally. Something in lyrical form is easier of memorizing. For this sole reason, most of Sanskrit scriptures are written in verse form. *Chandas* is a vidyā so that we can say, it is the science of metre. *Chandas* being the science of rhythm became a very important part in ancient education system as well. Here described the origin of chandas, its definition and development, a brief idea of Vedic and Classical metres, their types and the elements of Chandas. Further it is discussed how the Chandas plays an important roie in Vedic and Classical literature. The reference of considering *Chandas* as one of the *vedāngas* is discussed here. An account of the origin and development of Chandasśāstra has also been accommodated here. A note of the varieties of Vedic and Classical metres are added here. End of this paper a brief sketch of some elements of prosody viz., *gana*, yati, devatā, *varna* and gotra, bhūta *sankyā* are also included.

ඡන්දසින් තොර වූ ශබ්දයක් හෝ ශබ්දයකින් තොර ඡන්දසක් හෝ නොමැති බව හරතමුනිවරයා නිගමනය කරයි.[1] ඡන්දස හා ශබ්දය අතර සබඳතාව කොපමණදැයි එයින් ගම්‍ය වේ. ඡන්දසේ අපේක්ෂිතාර්ථය රිද්මයයි. ශබ්දයට රිද්මය ලැබෙන්නේ ඡන්දස මගිනි. ශබ්දය හා රිද්මය සුසංයෝග කිරීම  මානව ඉතිහාසයේ මුල් යුගයේ පටන් පවතින්නට ඇතැයි විශ්වාස කළ හැකි ය. පරිසරයේ සෑම

© පූජ්‍ය බලදොර ඉන්දජෝති හිමි

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

හඬක් තුළ ම රිද්මයක් පැවතීම මානවයාට ද එදා පටන් දැනෙන්නට ඇත. ඔවුන් ද හඬට රිද්මයක් දිය හැකි බව තේරුම් ගන්නට ඇත. ලිඛිත ඉතිහාසයට පැමිණෙන විට මිනිසා පද්‍යකරණයේ මුහුකුරා ගිය තත්ත්වයක් පෙන්නුම් කළේ එබැවිනි. වේදයෙහි ද රිද්මය භාවිත කොට තිබේ. ඍක් සාමන්හි පද්‍ය පමණක් නොව යජුර් වේදයෙහි ගද්‍යයෙහි පවා ඡන්දස පෙනේ. පැරණි යුගයේ මිනිසා තොරතුරු මතකයේ රඳවා ගත්තේ කටපාඩමෙනි. ඒ සඳහා තොරතුරු යම් රිද්මයකට පෙළගැස්වීම මතකයේ රඳවා ගැනීම පහසු කරවන්නක් විය. රිද්මය ස්වභාවයෙන් ප්‍රිය උපදවන්නකි. එබැවින් ප්‍රිය උපදවන රිද්මයට අනුව ශබ්ද පෙළගසා භාවිතයට ගැනීම මානව ඉතිහාසයේ භාෂා භාවිතය ඇරඹුමේ පටන් සිදු වන්නට ඇත.

## නිරුක්තිය

ඍග්වේද සර්වානුක්‍රමණියෙහි ඡන්දස යනු මාත්‍රා ගණනින් නිර්ණය කිරීම ලෙස හඳුන්වයි.[2] අථර්වවේදයට අනුව අක්ෂර සංඛ්‍යාවෙන් ගණනය කිරීම ඡන්දස් නම් වේ.[3] හලායුධයන් ද ඡන්දස යනු අක්ෂර සංඛ්‍යාව අනුව නම් කිරීමක් බව දක්වයි.[4] ජයදේවගේ ඡන්දස් කෘතියට භාෂ්‍යයක් සැපයූ හර්ෂථ වෘත්තයට ආධාර වූ වචන හා අක්ෂර සහිත බව ඡන්දස් ලෙස දක්වයි.[5]

ඡන්දසෙහි සම්භවය සම්බන්ධයෙන් විවිධ මත පළ වී තිබේ. ඡන්දෝවිත්ති අනුව ඡන්දස් යන්න ''චද්'' ධාතුවෙන් (ක්‍රියාමූලයෙන්) සැදුණකි. පාඨකයා පිනවීම්'' ප්‍රමෝදයට පත්කිරීම් (gladdening/ delighting) අර්ථයෙනි.[6] මෙහි දී ''ච'' යන්න ''ඡ'' බවට පත් ව තිබේ.[7] තවත් අදහසකට අනුව ඡන්දස් යන්න ''ඡද්'' ධාතුවෙන් නිපැයී තිබේ.[8] වැසීම් මුවහ කිරීම් (to cover) අර්ථයෙනි. ඡන්දොමඤ්ජරී කෘතියෙහි මෙය දෙ අයුරකින් විග්‍රහ වන බව පෙනෙයි.

1 ආවරණය කිරීම් අර්ථයෙන්[9] (to conceal/to cover)
2 වැළැක්වීම් අර්ථයෙන්[10] (to Prevent)

ඒ අනුව මිනිසා පවින් ආවරණය කරන අදහසක් ගම්‍ය වේ. සායන ද ඡන්දස ''ඡද්'' ධාතුවෙන් උපන් බව පවසයි. ආවරණය කිරීම්



(to cover) අර්ථයෙනි.[11] යාස්ක නිරුක්ති අනුව ඡන්දස් ඡද් ධාතුවෙන් ඉපදුණේ වේ.[12] ඓතරේය ආරණ්‍යකයේ ඉතා පැහැදිලි ව ම ඡන්දස් යනු පවින් වළකන අර්ථයෙන් දක්වා තිබේ.[13] ඡාන්දෝග්‍ය බ්‍රාහ්මණයේ දැක්වෙන්නේ දෙවියන් මරණයේ භයෙන් ආරක්ෂා වීමට ඡන්දස් මැවූ බවයි.[14]බොහෝ විද්වතුන්ගේ මතය ඡන්දස් යන්න පාණිනීගේ අර්ථකථනයට සමරූපී බවයි. ඔහු ඡන්දස් යනු සතුට ඉපදවීමේ (to please) අර්ථයෙන් දක්වා තිබේ.[15]මේ අනුව ඡන්දස් පිළිබඳ ව අර්ථකථන කිහිපයක් දැකිය හැකි අතර බොහෝ විද්වතුන් ඡද් හා ඡන්ද් යන ධාතු පිළිබඳ ව වැඩි අවධානය යොමු කරනු පෙනේ. මහාචාර්ය ඒ. සී. ශාස්ත්‍රි පෙන්වා දෙන්නේ යාස්ක දැක්වූ අර්ථයෙන් ඡද් (to cover) යන්න ඡන්දස්හි වෛදික අර්ථය සඳහාත්, පාණිනී දැක්වූ අර්ථයෙන් ඡන්ද් (to please) යන්න ලෞකික අර්ථය සඳහාත් වඩාත් ම යෝග්‍ය බවයි.[16]

## සංවර්ධනය

පැරණි අධ්‍යාපන ක්‍රමවේදයට වටිනා මෙහෙයක් ඡන්දස මගින් සිදු වී ඇත. ඡන්දස වේදාංගයන්හි විශේෂ විෂයයකි. එනම් වේදාංග අතර ඡන්දස ද වේ.[17] ඡන්දස වේදයේ මුඛය ලෙස හැඳින්වේ.[18] ආරම්භක අවස්ථාවෙහි ඡන්දස වේදයට සීමා විය. වේදය ක්‍රමානුකූල ව ඉගෙනීම පිණිස එයට උපකාර වශයෙන් විෂය හයක් දක්වා තිබේ. ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ති, ඡන්දස්, ජ්‍යෝතිෂ යන ඒ හය වේදාංග වශයෙන් ප්‍රකටය. මේ හය චතුර්වේදයට අදාළව ම එය උදෙසා ම කර තිබෙන හෙයින් වේදාංග නමින් ගැනේ. සාමාන්‍යයෙන් මෙය කොටස් වශයෙන් බෙදා බැලූ කළ පළමුවැනි හතරෙන් වේදය නිවැරදිව ඉගෙනීමට ද අනික් දෙකෙන් අවස්ථානුකූල ව යාග'' පූජා ආදිය කර ගැනීමට ද ඉවහල් වන සේ පිළියෙළ කර තිබෙන බැව් පෙනේ.[19] පාණිනී ආචාර්යවරයා ද ඡන්දස් වේදයේ පදනම ලෙස දක්වයි.[20] බෘහද්දේවතාහි කර්තෘ ශෞනක ද ඡන්දස නොදන මන්ත්‍ර හා සම්බන්ධ කටයුතු කිරීම පාපක්‍රියාවක් බව දක්වයි.[21] ඡන්දස් දැනුමෙන් තොරව වේද අධ්‍යයනය පව් සිදු වන්නක් බව ඡාන්දෝග්‍ය බ්‍රාහ්මණය පැහැදිලි ව දක්වයි.[22] වෘත්තයකින් තොරව මන්ත්‍රයක් සම්පූර්ණ නොවේ. එබැවින් මන්ත්‍ර හා ඡන්දස් අතර සමීප සබඳතාවක් පැවතීම ද විශේෂත්වයකි.

ලෞකික සංස්කෘතයේ ඡන්දස පිළිබඳ අංගෝපාංග ද සංඛ්‍යායන ශ්‍රෞත සූත්‍ර ''නිධාන සූත්‍ර'' ඓතරෙය ආරණ්‍යක ''ඍක් ප්‍රාතිශාඛ්‍ය'' සහ ඍග් හා යජුර්වේද අනුක්‍රමණිකා යනාදි වේද සාහිත්‍යයෙන් ම දැකිය හැකි ය. එයින් පෙනෙන්නේ සංස්කෘත ඡන්දස වෛදික යුගයේ පටන් ක්‍රමයෙන් සාකච්ඡාවට ලක් වෙමින් සංවර්ධනය වූ බවයි.

පිංගලනාග ඡන්දස් ශාස්ත්‍රයේ ආදි කර්තෘවරයායි. ඔහු ම පතඤ්ජලී නමින් ද හැඳින්වෙන බවට මතයක් ද වේ. ශයිතව, කාශ්‍යප, කාත්‍යායන, මාණ්ඩව්‍යය ආදීන් ද ඡන්දස් ශාස්ත්‍රය සම්බන්ධයෙන් කටයුතු කළ මුනිවරුන් ලෙස සැලකේ. භරතමුනි නාට්‍ය ශාස්ත්‍රයේ ඡන්දස් පිළිබඳ දීර්ඝ විස්තරයක් දක්වයි. නාට්‍යශාස්ත්‍රයේ වෘත්ත ගැන සඳහන් වන කරුණු පිංගලට වඩා පැරණි බව කීත් පවසයි.[23] විෂධර නම් අයෙක් ද ඡන්දස් කෘතියක් කළ බව සැලකේ. රාජශේඛර ඔහුගේ කාව්‍ය මීමංසාවෙහි ඡන්දසෙහි ඉතිහාසය පිළිබඳ ව අංශුමාත්‍ර වශයෙන් සාකච්ඡා කොට තිබේ. ඔහු ප්‍රථම කවියා නැතහොත් ඡන්දස් ශාස්ත්‍රයේ උත්පාදකයා ලෙස සැලකේ. කාව්‍යපුරුෂ ලෙස ද ඔහු හඳුන්වන්නේ එබැවිනි. නාමාර්ථය අනුව බලන කල විෂධර හා පිංගලනාග යනු එක් අයෙක් ම බව පැහැදිලි වේ. ඡන්දස් ශාස්ත්‍රයේ සංවර්ධනය සම්බන්ධයෙන් කටයුතු කළ අයෙක් ලෙස මින් අනතුරුව කතා බහට ලක් වන්නේ ශුක්‍ර පිළිබඳ ව යි. ඔහු කාව්‍යරචනා කර තිබේ. තෙවැන්නා වාල්මිකී වේ. වරාහමිහිරගේ බෘහත්සංහිතාවෙහි ඡන්දස් පිළිබඳ පරිච්ඡේදයක් ද වේ.[24] අග්නිපුරාණයේ වෛදික හා සංස්කෘත ඡන්දස් දෙවර්ගය පිළිබඳ ව ම විස්තර වේ. එය පිංගල ඡන්දස් අනුව ම අග්නිපුරාණය සංග්‍රහ කළ ගුරු කුලයේ දැක්වීමකි. විශේෂත්වය වන්නේ පිංගලනාගට වඩා වෙනස් සූත්‍ර මගින් ඉදිරිපත් කිරීමයි. බට්ටෝත්පල ඔහුගේ භාෂ්‍යයක ආදිතමයන් කළ ඡන්දස් පිළිබඳ උපුටාදැක්වීමක් කොට තිබේ. කීත් මහතා ද ඒ පිළිබඳ ව සඳහන් කර තිබේ.[25] නාරයණ වෘත්තරත්නාකර භාෂ්‍යයෙහි භාමහ විසින් ඡන්දස් සම්බන්ධයෙන් කෘතියක් කළ බවට උපුටා දැක්වීමක් කර තිබේ. ඡන්දෝවිත්ති නම් කෘතිය දණ්ඩින්ගේ යන මතය මත භේදයට තුඩු දුන්නකි. පිංගලනාග යනු ජෛමිනී බව ශාවර භාෂ්‍යයේ දැක්වේ. ජයදේව නැමැත්තෙකු ද ජයදේවඡන්දස් නමින් කෘතියක් කරන ලදි.



කේදාරභට්ට ලක්ෂ්‍යලක්ෂණාත්මක ව වෘත්තරත්නාකර නම් කෘතිය කරන කළේය. ඔහු ක්‍රි. ව. 1000ට පෙර විසූ බව සැලකේ. වෘත්තරත්නාකරය අනුව මාගධී භාෂාවෙන් වුත්තොදය රචනා කළ අතර ශ්‍රී රාම චන්ද්‍ර කවිභාරතී වෘත්තරත්නාකර පඤ්චිකාව රචනා කළේය. හෙළ බසින් රචිත එළුසඳැස්ලකුණ ද වෘත්තරත්නාකරයෙහි පරිවර්තනයකි. ක්‍රි. ව. 6 සියවසේ ලියවුණ ඡන්දොවිත්ති නම් කෘතියක් ද වේ. ක්ෂේමේන්ද්‍ර 11 සියවසේ දී සුවෘත්තිලකා නම් කෘතියක් කළේය. දමෝදර වාණීභූෂණ නමින් ද රත්නශේකර ඡන්දස්කෝශ නමින් ද ඡන්දස් කෘති සම්පාදනය කොට තිබේ. හේමචන්ද්‍ර ද ඡන්දෝනුශාසන නම් කෘතියක් කොට තිබේ. නාරායණ නම් අයෙක් 1550 දී වෘත්තරත්නාකර නම් කෘතියක් කොට තිබේ. ගණදාසගේ ඡන්දෝමඤ්ජරී ජනප්‍රිය කෘතියකි. 10 සියවස් වරවාණිනී නම් භාෂ්‍යය සමගින් කළ වාග්වල්ලභය ශ්‍රී දුක්ෂාභඤ්ජනකවි නම් අය විසින් ලියන ලද්දකි. දෙවන වාග්භට ද 15 සියවසෙහි ඡන්දෝමඤ්ජරී නම් කෘතියක් කළේය. නාරායණ වෘත්තරත්නාකරයෙහි භාමහ ද ඡන්දස් සම්බන්ධ කෘතියක් කළ බවට උපුටනයක් දක්වයි. වරරුචිගේ ව්‍යාකරණයට භාෂ්‍යයක් සැපයූ භාමහ කෙනෙක් ද වේ. මේ දෙදෙනා එක් අයෙක්දැයි දැන ගැනීමට සාක්ෂි දුර්ලභය. ඊශානදේවගේ ඡන්දස්තුති නම් කෘතියක් වේ. හේමචන්ද්‍ර ඡන්දෝනුශාසන නමින් කෘතියක් කොට තිබේ.[26] රාමචන්ද්‍ර චිරඤ්ජීව භට්ටාචාර්ය වෘත්තරත්නාවලී නම් කෘතියක් කළේය. ප්‍රාකෘත ඡන්දස සම්බන්ධ පිංගලට අයත් කළ කෘතියක් ගැන කියවෙන නමුත් එය ක්‍රි ව. 14න් පසු රචනයක් බව විශ්වාස කෙරේ. වෘත්තජාතිසමුච්චය නම් මෑත කාලීන ප්‍රාකෘත කෘතිය වීරහඬක නම් අයෙකුගේ වේ. වීරහඬක විසින් පිංගල, භුජගධීප, විෂධර, වෘද්ධකවි, ශලභාහ සහ හාල ගැන සඳහන් කර තිබේ. එයින් ප්‍රථම දැක් වූ තිදෙනා ඡන්දස් ශාස්ත්‍රය සම්බන්ධයෙන් කටයුතු කළෝ වෙත්. වෘත්තමාලා නමින් ලෞකික සංස්කෘත සම්බන්ධ ඡන්දස් කෘතියක් කවිකර්ණපූර නම් අයෙක් රචනා කොට තිබේ. වෘත්තමුක්තාවලී වෛදික ඡන්දස සම්බන්ධයෙන් ලියූ නූතන කෘතියක් වේ. තව ද ධීරේශ්වාරාචාර්ය කළ වෘත්තමඤ්ජරී ඡන්දස සම්බන්ධ නූතන කෘතියක් වේ. ශ්‍රැතබෝධය කාලිදාසගේ කෘතියක් ලෙස සැලකෙන නමුත් ඒ බව සනාථ කිරීමට කරුණු නොමැති බවත්, වරරුචිගේ කෘතියක් බව ඇතමෙකුගේ මතය බවත් කීත් පවසයි.[27]

## වෛදික හා ලෞකික ඡන්දස් වර්ග

වේදයෙහි ඍච් හෝ මන්ත්‍ර නමින් හැඳින් වූ ඡන්දස් සහිත පද්‍ය අඩංගු වේ. වේදයෙහි ප්‍රධාන වශයෙන් ගායත්‍රී, උෂ්ණික්, අනුෂ්ටුප්, බෘහතී, පඞ්ක්තී, ත්‍රිෂ්ටුප් හා ජගතී යන ඡන්දස් හමු වේ. ගායත්‍රී මුල් ඡන්දසයි. එහි අක්ෂර 24 කි. එහි පාදයකට අක්ෂරය බැගින් අක්‍ෂ 4ක් එක් කිරීමෙන් අනතුරුව එන උෂ්ණික් ඡන්දසට අක්ෂර 28කි. අනුෂ්ටුභ් ඡන්දසට අක්ෂර 32ක් ද වෘහතී ඡන්දසට 36ක් ද පඞ්ක්ති ඡන්දසට 40ක් ද ත්‍රිෂ්ටුප් ඡන්දසට 44ක් ද ජගති ඡන්දසට 48ක් ද අක්ෂර සිද්ධිය වේ. මේ එක් එක් ඡන්දසක් නැවත ආර්ෂී, දෛවී, ආසුරී, ප්‍රජාපත්‍ය යාජුෂී, සාම්නි, ආර්චී, බ්‍රාහ්මී ලෙස අෂ්ටවිධ වේ. අග්නි පුරාණයේ ඒ ඒ අක්ෂර නියමයන් පිළිබඳ ව විස්තරයක් දක් වේ.[28]ඒ අනුව ගායත්‍රී දෛවීටය අක්ෂර එකක් ද ගායත්‍රී ආසුරියට අක්ෂර 15ක් ද වේ.[29] ඡන්දස් හා අතිච්ඡන්දස් ලෙස වෛදික ඡන්දස් වර්ග දෙකක් වේ. ඡන්දස්හි මාත්‍රා 48 නො ඉක්මවයි. (ඇතැම් තැනෙක්හි කලාතුරකින් 50ක් හමු වේ.) අතිච්ඡන්දස්හි මාත්‍රා පනස් දෙකක් වේ. (ඇතැම් විට 106ක් වේ.)

ඡන්දස් නැවත වර්ග දෙකකට බෙදේ.

1. සච්ඡන්දස් (උදා -ගායත්‍රී)
2. විච්ඡන්දස් (උදා - මහාබෘහත්‍රී)

අතිච්ඡන්දස් ද වර්ග දෙකකට බෙදේ

1. මධ්‍යම වර්ග (52 සිට 76 දක්වා මාත්‍රා ඇති)
2. තෘතීය වර්ග (82 සිට 104 දක්වා මාත්‍රා ඇත)

මහාචාර්ය ශාස්ත්‍රී[30] ඒ ඒ ඡන්දස් සඳහා අයත් වන මාත්‍රා දැක්වීමට පහත දැක්වෙන වගුව ඉදිරිපත් කරයි. මෙහි පාදයක මාත්‍රා ගණනය වෛදික ක්‍රමයට වේ.

| ඡන්දස් | අතිච්ඡන්දස් | විච්ඡන්දස් |
|---|---|---|
| ගායත්‍රී - මාත්‍රා 24 | අතිජගතී - මාත්‍රා 52 | කෘති - මාත්‍රා 80 |
| උෂ්ණික් - මාත්‍රා 28 | ශක්වරී - මාත්‍රා 56 | ප්‍රකෘති - මාත්‍රා 84 |
| අනුෂ්ටුප් - මාත්‍රා 32 | අතිශක්වරී - මාත්‍රා 60 | ආකෘති - මාත්‍රා 88 |
| බෘහති - මාත්‍රා 36 | අෂ්ටි - මාත්‍රා 64 | විකෘති - මාත්‍රා 92 |
| පඞ්ක්ති - මාත්‍රා 40 | අත්‍යෂ්ටි - මාත්‍රා 68 | සංකෘති - මාත්‍රා 96 |
| ත්‍රිෂ්ටුප් - මාත්‍රා 44 | ධෘති - මාත්‍රා 72 | අතිකෘති - මාත්‍රා 100 |
| ජගතී - මාත්‍රා 48 | අතිධෘති - මාත්‍රා 76 | උත්කෘති - මාත්‍රා 104 |



නැවත ඉහත වගුවේ දැක්වුණ අයුරින් ඡන්දස්හි ගායත්‍රී සිට ජගතී දක්වා ද අතිච්ඡන්දස්හි අතිජගති සිට අතිධෘති දක්වා ද විච්ඡන්දස්හි කෘති සිට උත්කෘති දක්වා මාත්‍රා ඌන වීම මත පදනම් වෙමින් වර්ග පහකට බෙදේ. ඒ විරාට්, නිකෘත, ශුද්ධ, භුරික, ස්වාරාත් වශයෙනි. මේ අයුරින් ඡන්දස් වර්ග (7 × 5 = 35) 35කි. අතිච්ඡන්දස් 35කි. විච්ඡන්දස් 35කි. සංකුමතී, කකුද්මතී, නාගී, පිපීලිකාමධ්‍යා, යවමධ්‍යා ආදි අවිධිමත් විශේෂ වෛදික ඡන්දස් කිහිපයක් ද වේ. එමෙන් ම භරතමුනිවරයා දිව්‍යගණ, දිව්‍යෙතරගණ, දිව්‍යමානුෂගණ යනුවෙන් කිහිපයක් ද පෙන්වාදෙයි.[31] ඒවා නැවත වර්ග කෙරේ. ගායත්‍රී පටන් ජගතී දක්වා දිව්‍යගණ වේ. අතිජගතී පටන් අතිධෘති දිව්‍යෙතරගණ වේ. කෘති පටන් උත්කෘති දක්වා දිව්‍යමානුෂ වේ.[32]

වෛදික ඡන්දස පුළුල් වශයෙන් වර්ග 3කි. සමච්ඡන්දස, විෂමච්ඡන්දස, අතිච්ඡන්දස වශයෙනි. සෑම පාදයක ම මාත්‍රා සම නම් සමච්ඡන්දස් (ජගතී වැනි) නම් ද සමාන නොවේ නම් විෂමච්ඡන්දස් නම් ද (බෘහතී වැනි) වේ. ශක්වරී වැනි පද්‍ය දෙකක් හෝ කිහිපයක් අඩංගු ඡන්දස් අතිච්ඡන්දසට අයත් වේ. අතිච්ඡන්දස් ප්‍රගාතා ලෙස හැඳින් වේ.

වෛදික ඡන්දස්හි විසඳා ගත නොහැකි ගැටලුකාරී තැන් ද පවතී. ඒ යථෝක්ත ඡන්දස් හා නොගැළපෙන යම් යම් මාත්‍රා සිද්ධි සහිත වෛදික මන්ත්‍ර හමුවන බැවිනි. නිදසුනක් ලෙස ගායත්‍රී ඡන්දසේ මාත්‍රා 8ක් සහිත පාද 3 කින් යුක්ත විය යුතු වුව ද ඇතැම් තැන්හි මාත්‍රා 5ක් සහිත පාද 5කින් යුක්ත මන්ත්‍ර හමු වේ. එහි ගායත්‍රියට මාත්‍රා 25ක් වේ.

## වෘත්ත හෙවත් ගණ ඡන්දස්

වෛදික සංස්කෘතයේ පාදයකට අයත් අක්ෂර සංඛ්‍යාව ගණනය කිරීමෙන් වෘත්ත පිළිබඳ ව නිගමනය කළ ද ලෞකික සංස්කෘතයේ දී පාදයක මාත්‍රා එනම් ලඝු හා ගුරු ගණනයෙන් වෘත්ත පිළිබඳ නිගමනයකට පැමිණේ. වේදයේ ගණ භේදයක් නොසැලකිණි. පාදයක අක්ෂර කැටි නොහොත් ශබ්ද ගොනු සංඛ්‍යාව කොපමණ දැයි එහි සලකා බැලිණි. සංස්කෘතයේ දී පද්‍යයකට පාද 4ක් අවශ්‍ය බව සැලකේ.[33] සංස්කෘතයෙහි සමවෘත්ත, අර්ධ සමවෘත්ත, විෂම වෘත්ත වශයෙන් වෘත්ත තුන් ආකාර වේ.

සමවෘත්ත යනු පාද හතර ම සම ලක්‍ෂණ සහිත වෘත්තයයි.[34] මෙහි වර්ග 26කි. උක්තා, අත්‍යුක්තා, මධ්‍යා, ප්‍රතිෂ්ඨා, සුප්‍රතිෂ්ඨා, ගායත්‍රී, උෂ්ණික්, අනුෂ්ටුප්, බෘහතී, පඞ්ක්ති, ත්‍රිෂ්ටුප්, ජගතී, අතිජගතී, ශක්වරී, අතිශක්වරී, අෂ්ටී, අත්‍යෂ්ටී, ධෘති, අතිධෘති, කෘති, ප්‍රකෘති, ආකෘති, විකෘති, සංකෘති, අතිකෘති, උත්කෘති වශයෙනි. මෙහි උක්තා ඡන්දසේ පාද හතරට ම එක් අක්‍ෂරය බැගින් ද අත්‍යුක්තා ඡන්දසේ මාත්‍රා දෙක බැගින් ද ආදි වශයෙන් පිළිවෙළින් වැඩි වේ. ඒ අනුව අවසාන උත්කෘති ඡන්දසට අක්‍ෂර 26කි. 26ට වැඩි මාත්‍රා ප්‍රමාණයක් වේ නම් දණ්ඩක වෘත්ත නමින් ගැනේ. නගණ දෙකක් හා රගණ හතකින් මුල් ම දණ්ඩකය වේ. එය චණ්ඩවෘෂ්ටිප්‍රපාත දණ්ඩක නමි. මෙයට රගණය බැගින් එක් වෙමින් තවත් දණ්ඩක වේ. ඒ අනුව චණ්ඩවෘෂ්ටි ප්‍රපාත, අර්ණ, අර්ණව, ව්‍යාල, ජීමූත, ලීලාකර, උද්දාම, ශඞ්ක, ආරම, සඞ්ග්‍රාම, සුරාම, වෛකුණ්ඨ, සොත්කණ්ඨ, සාර, කාසාර, විස්තාර, සංහාර, නීහාර, මන්දාර, කේදාර, සාධාර, සත්කාර, සංස්කාර, මාකන්ද, ගෝවින්ද, සානන්ද, සන්දොහ, නන්ද වශයෙන් එක් එක් රගණය බැගින් වැඩිවීමෙන් නොයෙක් නම් ඇති දණ්ඩක වේ. අන්තිම දණ්ඩකයෙහි පාදයක නගණ දෙකක් හා රගණ තුන්සිය තිස් එකක් වේ. ඒ අනුව එහි එක් පාදයක අක්‍ෂර නවසිය අනූනවයකි. තව ද නගණ දෙකක් හා යගණ හතකින් ප්‍රචිතක දණ්ඩකය වේ. පෙර මෙන් යගණය බැගින් වැඩි කිරීමෙන් දණ්ඩක නිපදවිය හැකිය. තව ද නගණ දෙකක් හා ගුරු දෙකක යන ක්‍රමයෙන් සංහවික්‍රාන්ත ද, රගණයන්ගෙන්ම බඳනා ලද්දේ මත්තමාතඞ්ගලීලාකර ද, ලඝුවක ගුරක යන ක්‍රමයෙන් අනඞ්ගශේඛර ද, ගුරක් ලඝුවක් ක්‍රමයෙන් අශෝකමඤ්ජරී ද, සගණයන්ගෙන් ම බැඳ කුසුමස්තබක ද, යගණයන්ගෙන් ම බඳ සංහවික්‍රීඩ ද වශයෙන් දණ්ඩක වෘත්ත වේ.[35] උක්තා පටන් මේ සියල්ල සම වෘත්ත වේ.

අර්ධයක් පමණක් සම නම් ඒ අර්ධ සම වේ. එහි එක හා තුන පාදත් දෙක හා හතර පාදත් සමාන වේ.[36] උපචිත්‍ර, දෘතමධ්‍ය, වේගවතී, ආපාතලිකා, භද්‍රවිරාජ් කේතුමතී, ලලිතා, ආඛ්‍යානිකී, විපරීතාඛ්‍යානිකී, හරිණප්ලුතා, අපරවක්ත්‍ර, පුෂ්පිතාග්‍ර, යවමතී වශයෙන් අර්ධසම වෘත්ත වෘත්තරත්නාකරයේ දැක්වේ.



පාද එකිනෙකට විෂම නම් ඒ විෂම වෘත්ත නමි.[37] පදචතුරූර්ධ්ව, ආපීඩ, කලිකා, ලවලී, අමෘතධාරා ආදි වශයෙන් විෂම වෘත්ත වේ.

වෘත්තයක් ගමන් විලාසය අනුව නම් කිරීම් ද වේ. ධ්‍රැත, මධ්‍යා, විලම්භිත, ධ්‍රැතමධ්‍යා, ධ්‍රැතවිලම්භිත, මධ්‍ය විලම්භිත වශයෙන් එහි හංසයෙක් වැනිව,[38] සිංහයෙක් වැනි ව,[39] අලියෙක් වැනි ව,[40] ගමන් කරන විලාසය දනවයි.

## මාත්‍රා ඡන්දස්

මාත්‍රා ඡන්දසට අනුව ආර්යාදි ජාති වේ. ආර්යා යනු ප්‍රථම ජාතියයි. ඒ අනුව යමින් පථ්‍යා එකකි. මහාවිපුලා, මුඛවිපුලා, ජගනවිපුලා යයි විපුලා භේද තුනකි. මහාචපලා, මුඛචපලා, ජඝණචපලා භේද තුනකි. ඒ චපලා තුන පෙර කී පත්‍යාව හා චපලා තුන සමග මිශ්‍ර වීමෙන් භේද දොළහක් වේ. මුලින් කී පථ්‍යා ආදි හතරට මේ දොළහ එක් කිරීමෙන් ආර්යා භේද දහසයක් වේ.[41] මෙලෙසින් ගීති, උපගීති, උද්ගීති, ආර්යාගීති, සංගීති, සුගීති, ප්‍රගීති, අනුගීති, මඤ්ජුගීති, විගීති, චාරුගීති, වල්ගුගීති, ලලිතා, ප්‍රමදා, චන්ද්‍රිකා යන සියල්ල භේද දහසය බැගින් වේ. තව ද වෛතාලීය, ඖපච්ඡන්දසික, ආපාතලිකා, දක්ෂිනාන්තිකා, උදීච්‍යවෘත්ති, ප්‍රාච්‍යවෘත්ති, ප්‍රවෘත්තක, අපරාන්තිකා, චාරුහාෂිණී වශයෙන් භේද සහිතව වෛතාලීය ඡන්දස් ද, වක්ත්‍ර, පථ්‍යාවක්ත්‍ර, විපරීතපථ්‍යාවක්ත්‍ර, චපලාවක්ත්‍ර, යුග්මවිපුලා, විපුලා, භවි විපුලා, රවිවිපුලා, නවිපුලා, තවිපුලා වශයෙන් භේද සහිතව වක්ත්‍ර ඡන්දස් ද, අචලාධෘති, මාත්‍රාසමක, විශ්ලෝක, වානවාසිකා, චිත්‍රා, උපචිත්‍රා, පාදාකුලක වශයෙන් මාත්‍රාසමක ඡන්දස් ද, ශිඛා, ඛජා, අනඞ්ගක්‍රීඩා ආදි වශයෙන් ද මාත්‍රා වෘත්ත වේ.

ප්‍රස්තාරය, නෂ්ටය, උද්දිෂ්ටය, එකද්ව්‍යාදිලගක්‍රියාව, සංඛ්‍යානය, අධ්වයෝගය යනුවෙන් ෂට්ප්‍රත්‍යයක් වේ.[42] ප්‍රස්තාරය නම් ඡන්දසක වෘත්ත කෙතෙක් වේදැයි ප්‍රස්තාර කර ගන්නා ක්‍රමයයි. ඡන්දසක ඇතිතාක් ලඝුගුරු වින්‍යාසය මෙයින් දත හැකි වේ. නෂ්ටය නම් ගුරු ලඝු නොපෙනීගිය වෘත්තයක ගුරු ලඝු දන ගැනීමට

උපකාර වන ක්‍රමයයි. උද්දිෂ්ටය නම් ප්‍රස්තාරය දක්වා ඒ වෘත්තය කී වැන්න දැයි දැනගන්නා ක්‍රමයයි. ඒකද්ව්‍යාදිලගක්‍රියා නම් ඡන්දසෙහි ලැබෙන එකගුරු වෘත්ත, එකලඝු වෘත්ත, ද්වි ගුරු වෘත්ත, ද්විලඝු වෘත්ත යනාදිය දැනගැනීමට උපකාරී වන ක්‍රමයයි. සංඛ්‍යානය නම් ප්‍රස්තාර නොකරම ඡන්දසක වෘත්ත කොපමණ වේදැයි දැනගන්නා ක්‍රමයයි. අධ්වයෝගය නම් ඡන්දසක් ප්‍රස්තාර කිරීමට උවමනා භූමි ප්‍රමාණය කොපමණ දැයි දැනගන්නා ක්‍රමයයි.[43]

## මූලිකාංග

ඡන්දසේ ප්‍රධාන මූලිකාංග ගණ වේ. ගණ යන්න ගොනුව සමූහය යන අර්ථ ගෙන දෙයි. (a series, or a class, or a group) ව්‍යාකරණානුගත ගණ ක්‍රමයක් ද වේ. ඒ පාණිනී ව්‍යාකරණය අනුවයි. ඡන්දස් ගණ ක්‍රමය පිංගලනාගගේ විස්මිත නිර්මාණයකි, සම්පාදනයකි.[44] පිංගල ඡන්දස් සූත්‍රවලට අනුව ගණ 10කි. ම, ය, ර, ස, ත, ජ, භ, න, ල, ග, වශයෙනි. ඡන්දස් ශාස්ත්‍රයට අනුව මේ සියල්ල සංකේතානුරූප ව දක්වේ. මගණයේ පටන් නගණය දක්වා ගණයන්ට සංකේත තුන බැගින් වේ. ලගණය කෙටි බව හඟවන එක් සංකේතයකින් ද ග ගණය දීර්ඝ බව හඟවන සංකේතයකින් ද යුක්ත වේ.

මේ අනුව සියල්ල ගුරු නම් මගණය වේ ◡ ◡ ◡
ලඝුවක් හා ගුරු දෙකක් වේ නම් ඒ ය ගණය වේ. ◡ ◡
ගුරක්, ලඝුවක් හා ගුරක් වේ නම් ඒ ර ගණය වේ. ◡ ◡
ලඝු දෙකක් හා ගුරක් වේ නම් ඒ සගණය වේ. ◡
ගුරු දෙකක් හා ලඝුවක් වේ නම් ඒ ත ගණය වේ. ◡ ◡ -
ලඝු, ගුරු, ලඝු වේ නම් ඒ ජ ගණයයි. ◡ -
ගුරක් හා ලඝු දෙකක් වේ නම් ඒ භ ගණයයි. ◡ - -
ලඝු තුනක් වේ නම් ඒ නගණයයි.[45] - - -

ශ්ලෝක බන්ධනයේ දී පාදාන්ත ලඝුව ඇතැම් විට ගුරක් සේ ද ගණන් ගැනේ. අග්නි පුරාණයේ මේ ගණ අට වෙනත් කෙටි සූත්‍රයකින් දක්වේ. වෘත්තමාලාහි කර්තෘ කවිකර්ණපූර දස ගණයට අමතර ව හා ක වශයෙන් ගණ දෙකක් ද සඳහන් කරයි.[46] මේ වෘත්ත ඡන්දස් පිළිබඳ ගණ වේ. අක්ෂරවලින් මැනීම වෘත්ත වේ.



මාත්‍රා ඡන්දසට අයත් ගණ 5ක් ද වේ. ආර්යාදි ජාති ඡන්දස්හි භාවිත වන්නේ මේ පඤ්චවිධ මාත්‍රා ගණයන් ය.[47]
ඒවා නම්,

සර්ව ගුරු ගණය ◡ ◡
අන්ත ගුරු ගණය ◡
මධ්‍ය ගුරු ගණය ◡ _
ආදි ගුරු ගණය ◡ _ _
සර්ව ලඝු ගණය _ _ _ _

ගණ පිළිබඳ ශුභාශුභ තත්ත්වයන් ද වන බව කිය වේ. ඒ පිළිබඳ සෝරත හිමියන් දක්වන වගුව පහත දක් වේ.[48]

| ගණනාම | | දේවතා | මිත්‍රාදි | ඵල | ශුභාදි | උදාහරණ |
|---|---|---|---|---|---|---|
| මගණ | ◡◡◡ | මහී | මිත්‍ර | ශ්‍රී | ශුභ | ධීශ්‍රීස්ත්‍රී |
| යගණ | ◡◡ | ජල | දාස | ආයු | ශුභ | වරාසා |
| රගණ | ◡ _ ◡ | අග්නි | ශත්‍රැ | දාහ | අශුභ | කාගහා |
| සගණ | ◡ | වායු | ශත්‍රැ | විදේශ | අශුභ | වසුධා |
| තගණ | ◡ ◡ | ආකාශ | උදාසීන | ශූන්‍ය | අශුභ | සාතෙක්ව |
| ජගණ | ◡ _ | රවි | උදාසීන | රුජා | අශුභ | කදාස |
| භගණ | ◡ _ _ | චන්ද්‍ර | දාස | යශස් | ශුභ | කිංවද |
| නගන | _ _ _ | ස්වර්ග | මිත්‍ර | වෘද්ධි | ශුභ | නභස |

අශුභ ගණයක් මුලට යෙදුනහොත් එය නිදොස් කිරීම සඳහා දෙවනුව ශුභ ගණයක් යෙදීමෙන් එය ශුද්ධ කළ යුතු වේ. එලෙස යෙදිය යුතු ගණ පිළිවෙළ පිළිබඳ සෝරත හිමියන් පෙන්වාදෙන වගුව පහත දක්වේ.[49]

| ගණ | මිත්‍ර | දාස | උදාසීන | ශත්‍රැ |
|---|---|---|---|---|
| මිත්‍ර | සමෘද්ධ්‍යාදිය වේ | ජයාදි වේ | ශූන්‍ය වේ | බන්ධ පීඩා |
| දාස | සර්වකාර්යසිද්ධි | සියලු ලාභ | ධන නාශ | ශෝක |
| උදාසීන | ස්වල්පකාර්යසිද්ධි | ප්‍රභුත්වය | මන්ද ධෛර්ය | ස්වජන වෛර |
| ශත්‍රැ | භ්‍රම, නාශ | භාර්යා නාශය | සිය කුළය වැනසීම | විනාශය |

අඛිලානන්ද ශර්මා මේ ගණ පිළිබඳ ශුභාශුභ බව වෙනත් ආකාරයකින් දක්වයි. ම, න, ගණ මිත්‍ර වේ. භ, ය, භෘත්‍ය වේ. ජ, ර ගණ උදාසීන වේ. ත, ස ගණ නීච වේ යනුවෙනි. [50] නමුත් ශ්‍රී විරාජානන්ද අඛිලානන්දශර්මාගේ ඉහත අදහස සම්බන්ධයෙන් අදහස් දක්වමින් එය සියලල්ට පොදු නොම වන්නක් බවත්, ඒ ඒ පුද්ගලයන් ඔවුන් අදහන දේවතාවුන් සම්බන්ධ කරගනිමින් ඒ ඒ ගණවලට වෙනස් අගයන් පවරා ඇති බවත් පෙන්වා දෙයි. නමුත් පිංගලනාගයන් මේ ගණ සම්බන්ධයෙන් කිසිදු දිව්‍යමය සම්බන්ධයක් පවරා නොමැති බව පෙනේ.

## යතිය

යතිය ඡන්දොබන්ධ පද්‍යයක විරාමීය සංකේතයයි. යතිය සඳහා සමාන වචන කිහිපයක් වේ. ඡින්න, අවසාන, විශ්‍රාම, විරාම, විරති, ඡේද, අවසිති යනාදිය ඒ අතර වේ.[51] යතිය නාට්‍යශාස්ත්‍රයට අනුව නම් වචනයක් තුළ ස්වයංජාත නැවැත්මයි.[52] විරාම යනු පදාන්ත නැවැත්මයි.[53] පිංගල දක්වන්නේ යතිය යනු විච්ඡේදය බවයි.[54] වෘත්තරත්නාකරකරු යතිය විච්ඡේදය ලෙස දක්වයි.[55] ඡන්දොමඤ්ජරීකාර ගණදාස ද විශ්‍රාමස්ථානය යතිය බව දක්වයි.[56] යතිය යනු විශ්‍රාමස්ථලයයි.[57] හලායුධයන් පෙන්වාදෙන්නේ ස්ථල හෙවත් පද්‍යයක වචන කියවන අතර ගන්නා විරාමය යති නම් වන බවයි. ගංගාදාස දක්වන්නේ පාඨකයාගේ දිව විරාම ගැනීමට කැමති තැන යතිය බවයි. ධීරේශ්වරාචාර්ය වෘත්තමඤ්ජරී කෘතියේ හලායුධගේ මතය සනාථ කරයි.[58] මෙහි එන අනෙක් වැදගත් අදහසක් නම් කතුවරයා අවශ්‍ය ස්ථානයේ දී පාඨක කර්ණයට තදින් දැනවීමට අවශ්‍ය ස්ථානයෙහි යතිය තබන බවයි. ඔහු භාෂ්‍යයෙහි ද එය තවදුරටත් විස්තර කරයි.[59] වාමන ද යතිය සඳහා සෑහෙන තරම් කොටසක් වෙන් කොට තිබේ. ආචාර්ය බ්‍රහ්මානන්ද ත්‍රිපති සිය ඡන්දෝමඤ්ජරී කෘතියේ හැඳින්වීමේ දී යතිය පිළිගන්නා සහ නොපිළිගන්නා වශයෙන් දෙපක්ෂයක් පිළිබඳ සඳහන් කරයි.[60] ඒ අනුව හර, කෝහල, මාණ්ඩව්‍ය, අශ්වතර, ශෛතව යතිය නොපිළිගන්න කණ්ඩායමට අයත් වන්නාහු වෙති. යතිය පිළිගන්නා සෙසු කණ්ඩායමට වශිෂ්ඨ, කෞණ්ඩින්‍ය, කපිල, කම්බලමුනි, පිංගලනාග යනාදීහු අයත් වෙත්.



## භූත සංඛ්‍යා

ඡන්දසේ දී බොහෝ සෙයින් භාවිත වන්නක් ලෙස භූත සංඛ්‍යා දැකිය හැකි වේ. යම් සංඛ්‍යාත්මක අගයක් දැක්වීමට අවශ්‍ය අවස්ථාවෙහි එය සංඛ්‍යාවකින් නොදක්වා ඒ අදාළ සංඛ්‍යාවට සමානව ලොව ඇති වස්තුවක් දැක්වීම මෙහි සිදු කෙරේ. නිදසුනක් ලෙස හතර දැක්වීම අවශ්‍ය තැන්හි දී අබ්ධි හෙවත් සාගරය දක්වයි. ලොව සාගර ඇත්තේ හතරක් ම බැවිනි. එලෙස ඒ ඒ සංඛ්‍යා සඳහා ඡන්දසේ දී භාවිත වන වස්තු පිළිබඳ සටහනක් පහත වගුවේ දැක්වේ.

| | |
|---|---|
| එක | භූමි, වසුධා, භූ, අවනි, ඉන්දු |
| දෙක | පක්ෂ, හස්ත, පාද, නේත්‍ර, කර්ණ |
| තුන | ශිවනේත්‍ර, වහ්නි, අනල |
| හතර | වේද, අබ්ධි, සමුද්‍ර, අම්බුධි, යුග, අර්ථ |
| පහ | බාණ, ශර |
| හය | රස, තර්ක, ඍතු, රිපු, ගුණ, වේදාංග |
| හත | අශ්ව, මුනි, ඍෂි, |
| අට | නාග, භොගි, සර්ප |
| නවය | ග්‍රහ, අඞ්ක, |
| දහය | දිශා, දිග් |
| එකොළහ | රුද්‍ර |
| දොළහ | ආදිත්‍ය. මාස, |

## දේවතා

ප්‍රථම වරට ඍග්වේදයේ ඡන්දස් හතකට අදාළ ව දේවතාවන් හත් දෙනෙකු නම් කොට තිබේ. අග්නි ගායත්‍රියට ද ඉන්ද්‍ර ත්‍රිෂ්ටුභ්ට ද ආදි වශයෙනි.[61] අනතුරුව ශෞනක විසින් අත්තිච්ඡන්දසෙහි දේවතාවා ප්‍රජාපති ද විච්ඡන්දසෙහි දේවතාවා වායු ලෙසින් ද දක්වා තිබේ. තව ද බ්‍රහ්ම ඒකපදයන්හි ද පුරුෂ ද්විපදයන්හි ද දේවතාවන් ලෙස දක්වා තිබේ. පිංගල මේ සම්බන්ධයෙන් කිසිවක් ප්‍රකාශ නොකිරීම විශේෂයෙන් දැකිය හැක්කකි.

## වර්ණ

ශෞනක ඍක් ප්‍රාතිශාඛ්‍යහි දී ඡන්දස් සඳහා වර්ණ පවරා තිබේ. එහි පිසඞ්ග, කෘෂ්ණ, නීල, ලෝහිත, ස්වර්ණ පිළිවෙළින්

අනුෂ්ටුප්, බෘහති, පඞ්ක්ති, ත්‍රිෂ්ටුප්, ජගති ඡන්දස්වලට අයත් කොට තිබේ. පිංගලනාග ද මෙහි ජගතී සම්බන්ධ වර්ණ හැර ඉතිරිය එලෙසින් ම පිළිගනී. ඔහුට අනුව ජගතියට අයත් වර්ණය ගෞර වේ. ප්‍රාතිශාඛ්‍යයේ දී අතිච්ඡන්දසේ වර්ණය ශ්‍යාම බවත්, විච්ඡන්දසේ වර්ණය ගෞර බවත් දක් වේ. එමෙන් ම ඒක පදයේ වර්ණය නකුලවර්ණය වේ. ද්විපදයේ වර්ණය බභෘවර්ණය බව දක් වේ. බභෘවර්ණ යනු කුමක්දැයි පැහැදිළි නොමැත.

## ගෝත්‍ර

ප්‍රධාන ඡන්දස් හතට අග්නිවේශ, කාශ්‍යප, ගෞතම, අඞ්ගීරස, භාර්ගව, කෞශික, වශිෂ්ඨ වශයෙන් ගෝත්‍ර පිළිබඳ ව දක් වේ.

ඡන්දසේ අවයව පිළිබඳ ව නාට්‍යශාස්ත්‍ර ග්‍රන්ථයේ දක්වෙන අදහසට අනුව ඡන්දස හා සම්බන්ධ අවයව 9කි. එනම් සම්පත්, විරාම, පද, දෛවත, ස්ථාන, අක්ෂර, වර්ණ, ස්වර, අධිකවෘත්ත වශයෙනි.[62]

## නිගමනය

ශබ්දයට රිද්මය අන්තර්ගත කිරීම අපට මුලින් ම වේදයෙන් හමු වුව ද මානව ඉතිහාසයේ ඉතා ඈතක සිට විනෝදාස්වාදනීය අංගයක් වශයෙන් මානව ව්‍යවහාරයේ පවතින්නට ඇතැයි සිතිය හැකිය. මෙය මානවයා අතින් බිහිවී මානවයා තුලින් ම සංවර්ධනය වූ අංගයක් ලෙස පිළිගැනීම විද්‍යාත්මක වේ. ඡන්දසෙහි නිරුක්තිය සම්බන්ධයෙන් බොහෝ මත ඉදිරිපත් වුව ද පාණිනීගේ නිරුක්තිය ම වඩාත් යෝග්‍ය බව පෙනේ. එනම් ඡන්දස සතුට ඉපිදවීමේ (to please) අර්ථයෙන් ''ඡන්ද්'' ධාතුවෙන් නිපන් බවයි. ඡන්දස වේදාංගයක් වූයේ වේද ගීතිකා සඳහා සෞන්දර්යයක් ගෙන දීමට අදාළ ව ශබ්දයට රිද්මය ගැබ් කළේ ඡන්දසෙන් බැවිනි. මෙය විද්‍යාවක්, ශාස්ත්‍රයක් බවට දියුනු කොට ඉදිරිපත් කිරීමේ ගෞරවය පිංගලනාග මුනිවරයාට හිමි වේ. වේදයෙහි ගායත්‍රී, උෂ්ණික්, අනුෂ්ටුප්, බෘහතී, පංක්තී, ජගතී ලෙස ඡන්දස් කීපයක් පමණක් හමු වීමත් වෘත්ත රත්නාකරය වැනි කෘතීන්හි විශාල වෘත්ත සංඛ්‍යාවක් දැකිය හැකි වීමත් ඡන්දසෙහි සංවර්ධනයේ මග කෙසේ දැයි ප්‍රකට කරයි. සාමාන්‍ය ජන සමාජයේ ප්‍රභවය වී වේදයෙහි සංවර්ධිත අවස්ථාවකට පැමිණි ඡන්දස ආලෝකමත් අවස්ථාවකට පත් වන්නේ



ලෞකික කවියා අතිනි. වීර කාව්‍යයන්හි බහුලව ම භාවිත වන්නේ අනුෂ්ටුබ් ය. රාමායණයේ බොහෝ අනුෂ්ටුප් පද්‍යවලින් අනතුරු ව පරිච්ඡේදාවසානයෙහි ත්‍රිෂ්ටුප් පද්‍ය යොදයි. මහාභාරතයේ එබඳු වෙනසක් නො වේ. රාමයණයේ අනුෂ්ටුප්වලට අමතර ව ඉන්ද්‍රවංශා, ඉන්ද්‍රවජ්‍රා, උපේන්ද්‍රවජ්‍රා, වංශස්තවිලා, වශ්‍යදේවී, අනුපච්ඡන්දසික, ප්‍රහර්ෂිණී, රුචිරා, අපරවක්ත්‍රා, වසන්තතිලකා, පුෂ්පිතාග්‍රා, සුන්දරී යන ඡන්දස් ද මහා භාරතයේ එකී ඡන්දස්වලට අමතර ව රථෝද්ධතා, ප්‍රමාණිකා ඡන්දස් ද භාවිත වේ. මේ වීරකාව්‍ය දෙකට පසු රචනා වූ බව සැලකෙන භාගවත පුරාණයේ ඡන්දස් විසි පහක් පමණ දැකිය හැකි ය. නාට්‍යශාස්ත්‍රයේ ඡන්දස් තිහක් පමණ දක්වේ. මෙලෙස ඡන්දස ක්‍රමක්‍රමයෙන් වර්ධනය වූ බවක් පෙනෙයි.

මුලින් ශබ්දයට රිද්මය ගෙන දෙන්නක් පමණක් වුව ද පසුව ඡන්දස ශුභාශුභ තීරණය කෙරෙන අංගයක් බවට ද සංවර්ධනය විය. ඒ ඒ ගණ පිහිටුවීම මත ශුභ වේද අශුභ වේද යන්න තීරණය කෙරෙන බැවිනි. දේවතා, ගෝත්‍ර ආදිය තීරණය කිරීම ද මෙලෙසින් ම පසුකාලීන ව ඡන්දසේ සංවර්ධන අවධීන් ලෙස දක්විය හැකි ය.

**ආන්තික සටහන්**

1 ඡන්දහීනො න ශබ්දො අස්ති න ශබ්ද ඡන්දස්වර්ජිතඃ (නාට්‍යශාස්ත්‍රය xv.42)
2 යදක්ෂරපරිමාණං තත්ච්ඡන්දඃ (ඍග්වේද සර්වානුක්‍රමණී ii 6)
3 ඡන්දෝ අක්ෂරසංඛ්‍යාවච්ඡේදකම් (කාත්‍යායන සර්වානුක්‍රමණී 57 පිට)
4 ඡන්දශ්ශබ්දේනාක්ෂරසංඛ්‍යාවච්ඡන්දෝ’ත්‍රාභිධීයතෙ.. (ඡන්දශ්ශාස්ත්‍ර 3 පිට)
5 ඡන්දස්ශබ්දො වෘත්තාධාරවචනඃ අක්ෂරකෝශාත්මකත්වාත් (ජයදෙවච්ඡන්දස්) 31 පිට
6 චදි ආහ්ලාදේ (ඡන්දොවිචිති, 3 පිට)
7 චන්දෙරාදේශ්චඡඃ (වෛයාකරණසිද්ධාන්ත කෞමුදී, 4 උණාදිසූත්‍ර 658)
8 පිඞ්ගලච්ඡන්දස්සූත්‍ර
9 ඡදිසම්වාරණෙ (ධාතු 1577) (වෛයාකරණසිද්ධාන්ත කෞමුදී, 3, 279 පිට)
10 ඡදපවාරණෙ (ධාතු 1854) (වෛයාකරණසිද්ධාන්ත කෞමුදී, 3, 279 පිට)
11 පුරුෂස්‍ය පාපසම්බන්ධම් වාරයිතුමාච්ඡාදකත්වාත් ඡන්දා ඉත්‍යුච්චතේ (පිඞ්ගලච්ඡන්දස්සූත්‍ර)
12 ඡන්දාංසි ඡාදනාත්. (ඡාදි ආඡාදනේ) නිරුක්ත, දෛවතකාණ්ඩ xii.2
13 ඡාදයන්තිහවා එනම් ඡන්දාංසි පාපාත්කර්මණඃ (ඓතරෙය ආරණ්‍යක ii.1.6
14 දේවා වෛ මෘත්‍යෝර්විභ්‍යතස්ත්‍රයීම් විද්‍යාම් ප්‍රාවිශම්ස්තෙ
15 ඡන්දයති හ්ලාදයති ඉති ඡන්දඃ, චන්දෙරාදෙශ්ච ඡඃ (ඡන්දොමඤ්ජරී)

16 *PiEgalacchanda%sūtra*: *A study*, p.51

17 ශික්ෂා කල්පො ව්‍යාකරණාං නිරුක්තිං ඡන්දොජ්‍යොතිෂමිති. (මුණ්ඩකොපනිෂද් i.1.5)

18 ඡන්දො වෛ වෙදස්‍ය මුඛම් (පිඞ්ගලච්ඡන්දඃසූත්‍ර 46 පිට)

19 සෝමාරාම හිමි 120 පිට

20 ඡන්දස්පාදෞ තු වේදස්‍ය හස්තෞ කල්පොත'පත්‍යතේ
ජ්‍යෝතිෂාමයනම් චක්ෂුර්නිරුක්තම්ශ්‍රෝතමුච්‍යතෙ.
ශික්ෂාඝ්‍රාණම් තු වේදස්‍ය මුඛම් ව්‍යාකරණංස්මෘතම්
තස්මාත් සංගමධීත්‍යෛව බ්‍රහ්මලොකෙමහීයතේ. (පාණිනීයශික්ෂා 41-42)

21 අවිදිත්වා ඍෂිම් ඡන්දො දෛවතංයොගමේව ච
යො ධ්‍යාපයෙජ්ජපෙද් වාපි පාපීයාන් ජායතේ තු සඃ (බෘහද්දේවතා viii.136)

22 යො හ වා අවිදිතාඍෂෙයශ්ඡන්දොදෛවතවිනියෝගෙන බ්‍රාහ්මණේන මන්ත්‍රේණ
යාජයතී වාධ්‍යාපයතී වා ස්තාණුම් වාච්චති ගර්තෙ වා පාතයතෙ ප්‍රමීයතේ වා පාපීයාන් භවති (කාත්‍යායනානුක්‍රමණී i.1)

23 ඒ. බී. කීත්, *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* 629 පිට

24 ඒ. බී. කීත්, *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* 630 පිට

25 ඒ. බී. කීත්, *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* 630 පිට

26 ඒ. බී. කීත්, *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* 630 පිට

27 ඒ. බී. කීත්, *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* 630 පිට

28 ගායත්‍රී දෙවී චෛකාක්ෂරෝ භවේත් (අග්නිපුරාණ cccxxix.1)

29 (අග්නිපුරාණ 329)

30 *Vaidika O Laukika Chande PiEgala*, p. 72

31 සර්වේෂමේවවෘත්තානාම් තජ්ඥේයා ගණාස්ත්‍රයඃ
ද්වයෝ ද්වෙ‍්‍යතරශ්චෛව දිව්‍යමානුෂ ඒව ච. (නාට්‍යශාස්ත්‍ර xv.99)

32 ගායත්‍ර්‍යුෂ්නිගනුෂ්ටුභ්ච බෘහති පඞ්ක්තිරේවච
ත්‍රිෂ්ටුභ්ච ජගතී චෛව දිව්‍යායං ප්‍රථමො ගණඃ
තථාතිජගතිචෛව ශක්වරී චාතිශක්වරී
අෂ්ටිරත්‍යෂ්ටිරපි ච ධෘතිශ්චතිධෘති ගණහඃ
කෘතිශ්ච ප්‍රකෘකතිශ්චෛව හ්‍යාකෘතිස්තථා
සඞ්කෘත්‍යතිකෘතිශ්චෛව උත්කෘතිර්දියමානුෂඃ (නාට්‍යශාස්ත්‍ර xv. 100-102)

33 පාදශ්චතුරබාගඃ (පිඞ්ගලචන්දස්සූත්‍ර iv.10 )

34 අඞ්ග්‍රයො යස්‍ය චත්වාරස්තුල්‍යලක්ෂණ ලක්ෂිතාඃ
තච්ඡන්දශ්ශාස්ත්‍ර තත්වඥාඃ සමං වෘත්තං ප්‍රචක්ෂ්‍යතෙ (වෘත්තරත්නාකර i.14)

35 වැලිවිටියේ සෝරත හිමි 101-103 පිටු

36 ප්‍රථමාඞ්ඝ්‍රියොසමො යස්‍ය තෘතියශ්චරණො භවේත්
ද්විතීයස්තුර්ය්‍යවද්වෘත්තං තදර්ධසමමුච්‍යතේ (වෘත්තරත්නාකර i.15)

37 යස්‍ය පාදචතුෂ්කෙපි ලක්ෂ්මභින්නං පරස්පරම්
තදාහුර්විෂමං වෘත්තං ඡන්දශ්ශාස්ත්‍ර විශාරදාඃ ( වෘත්තරත්නාකර i.16)

38 හංසගතිවත් (වෘත්තමඤ්ජරී v.13)



39 සිංහවික්‍රමවත් උද්ධාතම් පයේත් (වෘත්තමඤ්ජරී v.13)

40 මරාලගතිවත් (වෘත්තමඤ්ජරී v.13)

41 වැලිවිටියේ සෝරත හිමි 46 පිට

42 ප්‍රස්තාරො නෂ්ටමුද්දිෂ්ටමෙකද්ව්‍යාදිලගක්‍රියා
සංඛ්‍යානමධ්වයෝගශ්ච ෂඩේතේ ප්‍රත්‍යයාඃ ස්මෘතාඃ

43 වැලිවිටියේ සෝරත හිමි 120-121 පිටු

44 "PiEgala is undoubtebly the earliest prosodist who had used this unit and was ver probably the originator of it.../" *The Culture Heritage of India*, V, p.306.

45 සර්වගුර්මො මුඛාන්තර්ලෞ යරාවන්ත ගලෞ සතෞ
ගමධ්‍යාද්‍යෞජ්භෞ ත්‍රිලොනොෂ්ටො භවන්ත්‍යත්‍ර ගණාස්ත්‍රිකාඃ (වෘත්තරත්නාකර i.7)

46 ගුරුවර්ණෝ ගසඤ්ඤාඃ ස්‍යාත් ලඝුවර්ණෝ ලසඤ්ඤකඃ
යතිවන්තෞ දීර්ඝහ්‍රස්වෞ වකෞ ව්‍යාච්‍යෂ්තෙ බුධිඃ (වෘත්තමාලා v.1)

47 ඥෙයාඃ සර්වාන්තමධ්‍යාදි ගරවොත්‍ර චතුෂ්කලාඃ
ගණාශ්චතුර්ලඝූපේතාඃ පඤ්චාර්යාදිෂු සංස්ථිතාඃ (වෘත්තරත්නාකර i.8)

48 වැලිවිටියේ සෝරත හිමි, *සරලා ව්‍යාකඛ්‍යා සහිත වෘත්තරත්නාකරය* 6 පිට

49 වැලිවිටියේ සෝරත හිමි, *සරලා ව්‍යාකඛ්‍යා සහිත වෘත්තරත්නාකරය* 7 පිට

50 මනෞ මිත්‍රෙ භයෞ භෘත්‍යෞ ජරාවුදාසීනෞ තසෞ නීචෞ (ඡන්දස්සූත්‍ර භාෂ්‍ය 239 පිට)

51 ගණඑකකලො නීරූප්‍යතේ ද්විකලශ්ච ත්‍රිකලශ්චතුර්කලඃ
අපි පඤ්චකලො,ථ ෂට්කලඃ ෂඩ්මේ ජාත්‍යුපයොගිනඃ ප්‍රියෙ (වෘත්තමඤ්ජරී 6.)

52 නියතඃ පදවිච්ඡේදෝ යතිරිත්‍යාභිධීයතේ (නාට්‍යශාස්ත්‍ර xv.86)

53 යථාරථස්‍ය සමාපතිඃ ස්‍යාත් ෂ විරාම ඉති ස්මෘතඃ (නාට්‍යශාස්ත්‍ර xv.90)

54 යතිර්විච්ඡේදඃ (පිඞ්ගලඡන්දස්සූත්‍ර vi.1)

55 යතිර්විච්ඡෙද සංඥිකා (වෘත්තරත්නාකර i.12)

56 යතිර්ජිහ්වෙෂ්ටවිශ්‍රාමස්ථානං කවිභිරුච්‍යතෙ (ඡන්දොමඤ්ජරී )

57 විච්ඡිද්‍යතෙ විභජ්‍යතෙ පදපාධොස්මින්නිති විච්ඡේදො විශ්‍රාමස්ථානම් ෂ ච යතිරිත්‍යුච්‍යතේ (පිඞ්ගලඡන්දස්සූත්‍ර vi.1)

58 සා යතී පාදපාථස්තු යත්‍ර විච්ඡිද්‍යතෙ (වෘත්තමඤ්ජරී 2)

59 විරතිඃ ශ්‍රව්‍ය (වෘත්තමඤ්ජරී 6)

60 ඡන්දොමඤ්ජරී, p .10

61 ඍග්වේද, X. 130. 4-5

62 සම්පද්විශ්‍රාමපාදශ්ච දෛවතස්ථානමක්ෂරම්
වර්ණඃ ස්වරොධීකාරං වෘත්තමිති ඡන්දොගතො විධිඃ (නාට්‍යශාස්ත්‍ර, XV.88)

## ආශ්‍රිත ග්‍රන්ථ


ප්‍රථමික මූලාශ්‍රය

- *Aitareya ĀraGyaka*, Anandasram Press Granthamala 38, Puna, 1898, Eng. Translation by A.B. Keith, Oxford, 1909
- *Acmādhyāyī* of PāGini (Vols.I-II), ed. by S.C. Basu. Motilal Benarsidass, Delhi, 1962
- *B[haddevatā*, ed. by A.A. Macdonell, Harvard Oriental Series, Cambridge, 1904, and Delhi, 1965
- *B[hatsaAhitā* of Varāhamihira, ed. by Sri Achyutananda Jha, Chowkhamba Vidhyabhavan, Varanasi -1, 2003
- *Chāndogyopanicad*, ed. by Limye, Puna, 1958
- *Chandomañjarī* of GaEgādāsa, ed. by Prof. Gurunatha Vidyanidhi, Chatra Pustakalay, Calcutta, *Bengali* era
- *Chandomañjarī* of GaEgādāsa, ed. by Dr. Dileep Kumar Kanjilalk, Modern Book Agency Private Ltd, Calcutta – 12, 1962
- *Chandomañjarī* of GaEgādāsa, ed. by Dr. Brahmananda Tripathi, Chowkhamba Surabharati Prakashan, Varanasi-221 001, 1992
- *Chandomañjarī* of GaEgādāsa, (with the com. *Sidhā* of Pt. Parameshwardin Pandey), ed. by Pt. S.S. Khanduri, Chowkhamba Krishnadas Academy, Varanasi – 221 001, Reprint, Samvat 2061
- *Chandoviciti* of Patañjali, ed. by Prof. B.R. Sharma in association with Prof. L.N. Bhatta, Rashtriya Sanskrit Vidyapeetha, Tirupati,2000
- *Chando'nukramaGī* of Śaunaka, Chowkhamba Sanskrit Series Office, Varanasi, 8thEdn., 1972
- *MuGakopanicad*, ed. by Pt. Durgacharan Sankhya-Vedantatirtha, Devasahitya Kutir, Calcutta, 1977
- *Nāmyaśāstra* of Bharata, (with the com. Abhinavabhārati), ed. by Dr. R.S. Nagar, Parimal Publications, 1988
- *Nāmyaśāstra* of Bharata, ed. by Pt. Kedar Nath, Bharatiya Vidya Prakashan, 1-U.B. Jawarhar Nagar, Bunglow Road, Delhi- 7, 1998
- *Nāmyaśāstra* of Bharata, (Pt. II), ed. by Umakanta Devasharma Sastri,





- Assamese Trans. By Nityananda Sastri, Axom NatyaSanmilan, Nagaon, Assam, 2006
- *Nirukta of Yāska* (with *Durgabhācya*), ed. by R.G. Bhandarkar (BSPS 85), Puna, 1942
- *PāGinīya-śikcā*, ed. by Manamohan Ghosh, Calcutta University, 1938
- *PāGinīya-śikcā*, ed. By Pramodabardhan Kaundinnyayan, Chowkhamba Vidyabhavan, Varanasi-1, 2004
- *PiEgalacchanda%sūtra* (with the com. of Halāyudha), ed. by Sri Sitanath Samadhyayi Bhattacharya, Kokkata, *Śaka* era 1837
- *Zgveda-saAhitā* (4 Vols.), ed. by F. Max Mūller, Varanasi, 1966
- *Śrutabodha* of Kālidāsa, ed. by Pt. Brahmasankara Miśra, Chowkhamba Vidhyabhavan, Varanasi-1
- *Suv[ttatilaka* of Kcemendra, ed. by Pt. Vrajamohan Jha, Chowkhamba Sanskrit Series Office, Varanasi-1, 1968
- *V[ttamālā* of KavikarGapūra (with the com. Bālasubodhinī) ed. by Dr. D.K. Sharma, New Bharatiya Book Corporation, Delhi-7, 1999
- *V[ttamañjarī* of Mahāmahopādhyāya Dhīreśvarācāryya Kaviratna, Department of History and Antiquarian Studies, Assam,Guwahati, 1961
- *V[ttaratnākara* of Pandit Kedārabhamma, ed. by Prof. Sri Ramachandra Kavi Bharati, Satyabhāmābāi PāGurañg , Bombay,1948
- *V[ttaratnākara* of Bhammakedāra, ed. by Pt. Madhusudhan Sashtri, Chowkhamba Krishnadas Acadey, Varanasi-1, 2nd Edn., 1994
- *V[ttaratnākara* of Bhammakedāra, ed. by Pt. Vaidya Nāth Śāstrī Varakale, Chowkhamba Sanskrit Series Office, Varanasi-1,1962

ද්විතීයක මූලාශ්‍රය

- සෝමාරාම හිමි, ජී. *සංස්කෘත සාහිත්‍ය වෛදිකයුගය*, විද්‍යාලංකාර මුද්‍රණාලය, 1952

- *සංස්කෘත සාහිත්‍ය ඉතිහාසය* (පරි.) ජී. එස්. බී. සේනානායක, ගුණසේන, 1965
- සෝරත හිමි, වැලිවිටියේ. *සරලාව්‍යාඛ්‍යා සහිත වෘත්තරත්නාකරය,* මහාබෝධි, කොළඹ. 1946
- Bhattacharyya, K. C. *Mahāmahopādhyāya Dhīreśvarācāryya*, Kamrup Anusandhan Samittee, Guwahati – 3rd Edn., 1996
- Bhattacharyya, S. *Jottings on Sanskrit Metrics*, Sanskrit College, Kolkata, 1963
- Murty, R.S.*Vedic Prosody*, Vohra Publishers & Distributors, Allahabad, 1st Edn., 1988
- Sastri, A.C.*PiEgalacchanda%sūtra – A Study*, University of Calcutta, Calcutta, 1987


# The Significant Moral Values of Proverbs In Sanskrit Allegories

**Ven. Walapane Gnanasena Thero**

සංස්කෘත සාහිත්‍ය වූ කලී විවිධ විෂය ක්ෂේත්‍රයන් ආවරණය කරන, පෘථුල පරාසයක් තුළ පැතිරී පවතින කල්ප වෘක්ෂයක් ලෙස හැඳින්විය හැකි ය. ඒ තුළ නොලද හැකි සාහිත්‍යාංගයක් නැති තරම් ය. සාහිත්‍යය විශේෂයක් ම පුද්ගල ජීවිතයට අතිශය සමීප සබඳකම් දක්වයි. විශේෂයෙන් ම සංස්කෘත සාහිත්‍යයේ එන උපදේශ කාව්‍ය, උපදේශාත්මක කාව්‍ය, උපමා කථා, උපහාසාත්මක කථා, සුභාෂිත රචනා පුද්ගල ජීවිතයේ ගුණාත්මක සංවර්ධනය උදෙසා ඉමහත් ප්‍රයත්නයක යෙදෙයි. ඒ අතර පංචතන්ත්‍රය - හිතෝපදේශය වැනි උපමා කථා ඇතුළත් රචනා ගුණ-ධර්මයන්ගෙන් පමණක් නොව වාක් පටුත්වය, නීති විද්‍යාත්මක දැනුමෙන් පුද්ගලයා සන්නද්ධ කරනු පෙනේ. පුද්ගලයා සතු දුර්ගුණ උපහාසාත්මක ව හෙළාදකිමින් ගුණ ධර්ම අගය කරයි. සමහර විටෙක මිනිසා තුළ ඇති දුර්ගුණ පැහැදිලි කරනු පිණිස තිරිසන් සතුන්ගේ චරිත ආදේශ කර පෙන්වයි. මේ සඳහා භාවිතා කළ ආප්තෝපදේශ ඉතා ඉහළ අගයක් ගෙන තිබේ. එවැනි ආප්තෝපදේශ රාශියක් මෙම ලිපිය හරහා ගොනු කර ඇත.

## Approach:

Sanskrit Literature is the most popular one among the world literatures. The vast area in the relevant field is covered by the literature of Sanskrit. The commencement of Sanskrit literature is evident since Vedic era. According to the specific features of Sanskrit literature it can be classified as follows. The literature in the Vedic era, in which are included *Saṁhitas* (to wit *Rig Saṁhita, Yajur Saṁhita, Sāma Saṁṁhita and Atharvan Saṁhita*) and that the

© **Ven. Walapane Gnanasena Thero**

සංස්. මහාචාර්ය පැට්‍රික් රත්නායක, ආචාර්ය කේ. බී. ජයවර්ධන, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දිනලි ප්‍රනාන්දු
**මානවශාස්ත්‍ර පීඨ ශාස්ත්‍රීය සංග්‍රහය, 23 කලාපය, 2014/2015**
මානවශාස්ත්‍ර පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය